# ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

# පුරප්පාඩු

ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අනුබද්ධිත පරිසර අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනයකි.

අප සමාගමේ පහත තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් **අභ්‍යන්තර සහ බාහිර** අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගණකාධිකාරී

**බාහිර අයදුම්කරුවන්**

**අවශ්‍ය සුදුසුකම් :** පහත 1 හා 3 **හෝ** 2 හා 3

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ගණකාධිකරණ / මූල්‍ය ක්ෂේත්‍රයෙන් අන්තර් මධ්‍යම පරීක්ෂණයට සමත්වීම.

    (පිළිගත් වෘත්තීය ගණකාධිකරණ ආයතනයක – ICASL / CIMA / ACCA වරලත් ගණකාධිකරණ පරීක්ෂණය සම්පූර්ණ කර එහි සාමාජිකයෙකු වීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ)

03. උපාධිය ලබා ගැනීමෙන් පසුව තනතුරට අදාළව ගිණුම්කරණ / මූල්‍ය අංශයෙන් අවම වශයෙන් වසර 3 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**අවශ්‍ය සුදුසුකම් :** පහත 1 හෝ 2

01. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු අධ්‍යාපන සුදුසුකම් (1 හා 3 හෝ 2 හා 3)

හෝ

02. ගිණුම්කරණ / මූල්‍ය ක්ෂේත්‍රයෙහි කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) තනතුරෙහි අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය -** MM 1-1 (රු. 53,175-1,375x10-1,910x15 - රු. 95,575.00)
සහ ආයතනය ලබාදෙන අනෙකුත් දීමනා

**සියළුම අයදුම් කරුවන්**

- අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් ඉහත සඳහන් සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- **වයස් සීමාව -** වයස අවු. 22 ට නොඅඩු විය යුතු අතර, අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක / සංවිධානයක සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)
- අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද සහ අමතර සුදුසුකම් සනාථ කළ හැකි සහතික පත්‍ර වල සහතික කරන ලද ඡායා පිටපත් ජීවදත්ත පත්‍රිකාව සමඟ අමුණා එවිය යුතු අතර, විද්‍යුත් තැපැල භාවිතා කරන්නේනම් සහතික කරන ලද සියලුම සහතික පත්‍ර පිටපත් ස්කෑන් කර පහත සඳහන් කරන ලද ආයතනයේ ඊමේල් ලිපිනයට එවිය යුතුය.
- කොන්ත්‍රාත් පදනම යටතේ වසරක කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්යය සාධනය පදනම් කරගෙන කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

**සටහන**

- සේවකයාගේ වැටුපෙන් 8% සේවක අර්ථසාධක අරමුදල සඳහා අයකරන අතර ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% බැර කරනු ලැබේ.

  ඔබගේ ජීවදත්ත ඇතුළත් අයදුම්පත් ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර සහිතව **2021.09.20 වන දිනට හෝ ඊට පෙර** පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ gsmbts2001@gmail.com යන විද්‍යුත් තැපැල වෙත ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් ජීවදත්ත පත්‍රිකාව සමඟ සහතික කරන ලද සියලුම සහතික පත්‍ර පිටපත් ස්කෑන් කර එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**ප්‍රධාන විධායක නිලධාරී**
**ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම,**
**අංක 190/ඒ, රත්නවීර ගොඩනැගිල්ල,**
**ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.**
**දු. අ. 011-2824025 / 011-2827855**